# රෝගය පැතිරීම වැළැක්වීම

**මදුරුවන් බෝවීම වැළැක්වීම**

- ඊඩිස් මදුරුවන් බෝවිය හැකි ස්ථාන (ටින්, කෝප්ප, පොල්කටු වැනි) සුදුසු පරිදි විනාශ කිරීම.
- කැලි කසල නිසි ලෙස බැහැර කිරීම.
- නිවස අවට පරිසරය පිරිසිදුව තබා ගැනීම.

**මදුරුවන් දෂ්ට කිරීම වළක්වා ගැනීම**

- මදුරු විකර්ෂක ආලේපන ගැල්වීම.
- සිරුර වැඩි ප්‍රමාණයක් ආවරණය වන සේ ඇඳුම් භාවිතය.
- මදුරුවන් නිවසට ඇතුලුවීම වැළැක්වීමට විශේෂිත තිර (Screens) භාවිතය හා දොර ජනෙල් හොඳින් වසා තැබීම.
- නිදාගැනීමේදී මදුරු දැල් භාවිතය.

- අවදානම් රටක සංචාරයකින් පසු ලංකාවට පැමිණ සති 2 ක් ඇතුළත රෝග ලක්ෂණ ඇති වුවහොත් සුදුසුකම් ලත් වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීම.
- සිකා පැතිර යන ප්‍රදේශයක සංචාරය කිරීමේදී මදුරු දෂ්ටනයන් වළක්වා ගැනීමට සුදුසු පියවර අනුගමනය කිරීම.

# ගර්භනී කාන්තාවන්ට

- ගර්භනී හෝ ඉදිරියේදී ගර්භනීභාවය බලාපොරොත්තු වන කාන්තාවක් දැනට රෝගය වසංගත තත්ත්වයෙන් පැතිර යන රටවල සංචාරය කිරීමට බලාපොරොත්තු වන්නේ නම් වසංගත තත්ත්වය පහව යන තුරු සංචාරය කල් දැමීම.
- ගර්භනී හෝ ඉදිරියේදී ගර්භනීභාවය බලාපොරොත්තු වන කාන්තාවකට සිකා පැතිර යන ප්‍රදේශයක සංචාරය කිරීමට සිදුවුවහොත් මදුරු දෂ්ටනයන් වළක්වා ගැනීමට සුදුසු පියවර අනුගමනය කිරීම.
- දැනට සිකා රෝගය සක්‍රියව පැතිර යන ප්‍රදේශයක සංචාරය කර පැමිණෙන ගර්භනී මව්වරුන් ලංකාවට පැමිණ දින 5 ක් ඇතුළත සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකු හමුවී උපදෙස් ලබා ගත යුතුය.

**වැඩි විස්තර සඳහා**

මහජන සෞඛ්‍ය පරීක්ෂක
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි
ප්‍රාදේශීය වසංගත රෝග විද්‍යාඥ
අමතන්න

දුරකථනය : 0112 695112

**වසංගත රෝග විද්‍යා අංශය**

සෞඛ්‍ය අමාත්‍යංශය

*www.epid.gov.lk*

# සිකා වෛරස් රෝගය



**දැනට රෝගය පැතිර ඇති ප්‍රදේශ**

- බ්‍රසීලය, කොළොම්බියාව සහ බොහෝ දකුණු ඇමරිකානු රටවල්
- මධ්‍යම ඇමරිකානු රටවල්
- කැරිබියානු දූපත්
- ආසියානු රටවල්:

සිංගප්පූරුව, මැලේසියාව, තායිලන්තය, පිලිපීනය හා ඒ අවට රටවල්

## රෝගය පැතිරීම

- සිකා වෛරසය බොහෝ විට පැතිරෙන්නේ ඊඩිස් ගණයේ මදුරුවන් දෂ්ට කිරීම මගිනි.
- ආසාදිතයෙකු සමග ලිංගික ඇසුරකින් හෝ ආසාදිත ගර්භනී මවකගෙන් ඇගේ කළලයට වෛරසය සම්ප්‍රේෂණය විය හැක.

## රෝග ලක්ෂණ

බහුලව දැකිය හැකි රෝග ලක්ෂණ වනුයේ,

- උණ
- හන්දිපත් වේදනාව
- ඇස් රතු පැහැති වීම (Conjunctivitis)
- සමේ ඇතිවන කුෂ්ටය
  (Maculo Papular Rash)

මීට අමතරව

- හිසරදය
- මස්පිඩු වේදනාව
- ඇස වටා ඇතිවන වේදනාවද ඇතිවිය හැක

- වෛරසය ශරීරයට ඇතුළු වූ පසු රෝග ලක්ෂණ ඇතිවීමට සාමාන්‍යයෙන් දින 2 සිට සතියක පමණ කාලයක් ගතවේ.
- වෛරසය ශරීරගත වූ අයගෙන් බහුතරය කිසිදු රෝග ලක්ෂණයක් නොපෙන්වයි.
- වෛරසය ශරීරගත වූ අයගෙන් 20% ක් පමණ රෝග ලක්ෂණ පෙන්වයි.
- රෝග ලක්ෂණ දින 2 සිට දින 7 දක්වා පමණ කාලයක් පැවතිය හැක.

## ප්‍රතිකාර

දැනට රෝගය සඳහා එන්නතක් හෝ විශේෂිත ඖෂධ ප්‍රතිකාරයක් නොමැත.

## රෝග සංකූලතා

- ගර්භනී කාන්තාවකට රෝගය වැළඳුනු විට ගබ්සා වීම හෝ කළලයේ මධ්‍ය ස්නායු පද්ධතියේ වර්ධනය අඩාල වීමෙන් ප්‍රමාණයෙන් කුඩා හිස් සහිත දරුවන් (microcephaly/ මයික්‍රොසෙෆලි) බිහිවීමේ අවදානමක් ඇත.
- ඉතාම කලාතුරකින් වෛරස් ආසාදනයට පසුව ඇතිවන ස්නායු සංකූලතාවක් වන Guillain Barre Syndrome ඇතිවිය හැකි අතර එහිදී හුස්ම ගැනීමේ අපහසුතා සහ මාංශපේශි වල අක්‍රියතා ඇතිවිය හැක.

## රෝගය වැළඳුනු පසු අනුගමනය කළ යුතු පියවර

- ශරීරය අධිකව වෙහෙසීමෙන් වැළකී විවේක ගැනීම.
- සිරුර විජලනය වීම වැළැක්වීම සඳහා ප්‍රමාණවත් පරිදි දියර වර්ග පානය කිරීම.
- උණ සහ වේදනාව සමනය සඳහා නිර්දේශිත මාත්‍රාව අනුව පැරසිටමෝල් ඖෂධය ගැනීම.
- ඇස්ප්‍රින් හෝ NSAIDS කාණ්ඩයේ ඖෂධ (බෲෆන්, ඩයික්ලෝෆිනැක් වැනි) භාවිතයෙන් වැළකීම.
- ශ්වසන අපහසුතා, මාංශ පේශි දුර්වලතා ඇතිවුවහොත් වෛද්‍ය උපදෙස් පැතීම.
- අන් අයට රෝගය පැතිරීම වැළැක්වීම සඳහා නිදා ගැනීමේදී මදුරු දැල් භාවිතය.
- ඊඩිස් මදුරුවන් බෝ නොවන පරිදි නිවස සහ නිවස අවට පිරිසිදුව පවත්වා ගැනීම.
- රෝගය පිළිබඳව ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක, හෝ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියට දැනුම් දීම.